*[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]*

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

| 08 ශ්‍රේණිය | විෂයය - ගණිතය | පත්‍රය I/II | කාලය පැය - 2 යි. |
|---|---|---|---|

නම ..................................................................................................................................................................

## 1 පත්‍රය

**සැලකිය යුතුයි.**

- **1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **ඒක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.**

1) 3 , 7 , 11 , 15 ... මෙම සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක ලියන්න.

2) පහත සඳහන් ප්‍රකාශ නිවරදි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද ඉදිරියෙන් යොදන්න.


සමාන්තරාස්‍රයක භ්‍රමක සමමිති ගණය 2 කි. (..........)

$2x$ හා $4xy$ හි මහා පොදු සාධකය $x$ වේ. (..........)

3) මුහුණතක පරිමිතිය 20 cm වන ඝනකයක පැත්තක දිග සොයන්න.

4) $1\frac{4}{5} \div \frac{3}{5}$ සුළු කරන්න.

5) රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ $a$ හි අගය සොයන්න.




6) පූර්ණ වර්ග සංඛ්‍යාවක එකස්ථානයේ තිබිය **<u>නොහැකි</u>** ඉලක්කම් දෙකක් ලියන්න.

7) සාධක දෙකක ගුණිතයක් ලෙස දැක්වීමට සකසා ඇති පහත ප්‍රකාශනයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

$3a + 15b -$ ....... = $3( a +$ ....... $- 4)$


8) 15034 kg මෙය මෙට්‍රික් ටොන් සහ කිලෝ ග්‍රෑම් වලින් ලියන්න.

9) $25\,x^2$ ගුණිතයක බලයක් ලෙස ලියන්න.

10) $x = 3$ වන විට $2(3x - 1)$ හි අගය සොයන්න.

11) $\dfrac{-36}{\square \times (-2)} = \dfrac{-36}{+12} = \square$ මෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

12) දී ඇති රූපයේ $M\hat{O}N$ අගය සොයන්න.





13) i. (-3) + (+5) සුළු කරන්න.

ii. $(-1)^{2025}$ අගය ලියන්න.

14) 2 : 5 අනුපාතයට අනුරූප ප්‍රතිශතය ලියන්න.

15) සුළු කරන්න. $5(x + 2) - 3(x + 5)$

16) රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.




17) සුළු කරන්න. $5 - 2 \times 1.25$

18) විසඳන්න. $2y - 1 = 3$

19) $x$ හා $38^0$ යනු අනුපූරක කෝණ යුගලයකි.

i. $x$ හි අගය සොයන්න.

ii. $x$ හි පරිපූරක කෝණයේ අගය සොයන්න.

20) $\sqrt{5^2a^2b^2}$ සොයන්න.

**11 පත්‍රය**

- ❖ **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**
- ❖ **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.**

1)


a) ඝන වස්තු පාඩමේදී ඔබ හඳුනාගත් ඔයිලර් සම්බන්ධය , ප්ලේටෝ කැට පිළිබඳ කරුණු සිහිපත් කර ගන්න.

(i) සවිධි අෂ්ටතලය , ඝනකය ප්ලේටෝ කැට දෙකකි.වෙනත් ප්ලේටෝ කැට දෙකක් නම් කරන්න.(ල 2)

(ii) ප්ලේටෝ කැට කීයක් තිබේ ද? (ල 1)

(iii) මුහුණත් 4 ක් ඇති ප්ලේටෝ කැටය නම් කරන්න. (ල 1)

(iv) රූපයේ දැක්වෙන ඝන වස්තුවේ මුහුණත් ගණන , ශීර්ෂ ගණන හා දාර ගණන ලියා ඔයිලර් සම්බන්ධයට ගැලපෙන බව පෙන්වන්න. (ල 3)



b) රසකැවිලි නිෂ්පාදකයෙක් රටකජු හා පරිප්පු 4 : 3 ද පරිප්පු හා මුරුක්කු 1 : 1 ද අනුපාතයට මිශ්‍ර කරමින් සාදන ලද මිශ්‍රණයක් පැකට් කර විකිනීමට අදහස් කරයි.

(i) රටකජු , පරිප්පු හා මුරුක්කු මිශ්‍ර කරන අනුපාතය සරලම ආකාරයට දක්වන්න. (ල 2)

(ii) 20 kg ක මිශ්‍රණයක් සකස්කර ගැනීම සඳහා එකතු කළ යුතු මුරුක්කු ප්‍රමාණය kg කීයද? (ල 2)

(iii) මිශ්‍රනයේ රටකජු ප්‍රතිශතය 50% ට වඩා අඩු බව පෙන්වන්න. (ල 2)

(iv) රු 120 ක් ව තිබූ ඉහත වර්ගයේ පැකට් එකක මිල් 10% න් ඉහළ ගොස් ඇත.


a) පැකට් එකක් රුපියල් කියකින් වැඩිවී තිබේ ද? (ල 2)

b) පැකට් එකක නව මිල සොයන්න. (ල 1)

2) (a)

(i) ඉදිරියෙන් දැක්වෙන රූපයේ පරිමිතිය සඳහා වීජීය ප්‍රකාශනයක් ලබාගන්න. (ල 2)

(ii) $x = 5$ ද $y = 2$ ද ආදේශ කර රූපයේ පරිමිතිය සොයන්න. (ල 2)





(b) PRST සෘජුකෝණාස්‍රයේ PT මධ්‍ය ලක්ෂ්‍යය V ද PR හි මධ්‍ය ලක්ෂ්‍ය Q ද ST= 12 cmද වේ.

(i) PQV ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න. (ල 2)

(ii) QRS ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න. (ල 2)

(iii) TSQV චතුරස්‍රයේ වර්ගඵලය සොයන්න. (ල 3)




3) A= { 2, 3 , 5 ,7 }

B= { "COMMUNICATION" යන වචනයේ අකුරු }

H= { 7 ත් 10 ත් අතර ප්‍රථමක සංඛ්‍යා}

(i) A කුලකය පොදු ලක්ෂණයක් මගින් ලියන්න. (ල 2)

(ii) B කුලකය අවයව සහිතව ලියා n(B) සොයන්න. (ල 2)

(iii) n (H) කියද? (ල 2)

(iv) ∈ හා ∉ යන සංකේත අතරින් හිස්තැනට ගැලපෙන සංකේතය ලියන්න.

9.......... H (ල 2)

(v) n (H) = n (P) වන ලෙස පවතින P කුලකයක් පොදු ලක්ෂණයක් මගින් ලියන්න. (ල 3)

4) (a) පහත දැක්වෙන සමීකරණ විසඳන්න.

(i) $\frac{x}{3} - 2 = 7$ (ල 2)

(ii) $2(a-1) = 8$ (ල 2)

(b) පොතක මිල පෑනක මිල මෙන් දෙගුණයට වඩා රු 70 ක් වැඩිය. පොත් 3 ක් හා පෑන් 2ක් මිලට ගැනිමට රු 410 ක් වැය විය.


(i) පෑනක මිල රු $x$ ලෙස ගෙන පොතක මිල $x$ ඇසුරින් දක්වන්න. (ල 2)

(ii) ඉහත තොරතුරු අනුව $x$ ඇසුරින් සමීකරණයක් ලියා විසඳන්න. (ල 3)

(iii) පොතක මිල සොයන්න. (ල 2)

---


5) (a) දී ඇති රූපයේ AB හා CD සරල රේඛා O හිදී එකිනෙක ඡේදනය වේ. හේතු දක්වමින්




(i) $D\hat{O}B$ හි අගය සොයන්න. (ල 2)

(ii) $X\hat{O}D$ හි අගය සොයන්න. (ල 2)

(b) දී ඇති රූපයේ තොරතුරු අනුව හේතු දක්වමින්




(i) $x$ හි අගය සොයන්න. (ල 2)

(ii) $m$ හි අගය සොයන්න. (ල 2)

(iii) $y$ හි අගය සොයන්න. (ල 3)

---

6) (a) $\frac{3}{5}$ ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ල 2)

(b) 215 × 13 = 2795 වේ. මෙම තොරතුරු භාවිතා කරමින් අගය සොයන්න.

(i) $2.15 \times 1.3$ (ල 1)

(ii) $\frac{27.95}{0.215}$ (ල 2)

c) සුළු කරන්න.

(i) $\frac{5}{8} \times 1\frac{2}{5}$ (ල 3)

(ii) $4\frac{4}{5} \div \frac{8}{11}$ (ල 3)

---

7) (a) ත්‍රිකෝණ සංඛ්‍යා රටාවේ පොදු පදය $\frac{n(n+1)}{2}$ වේ.

(i) ඒ අනුව ත්‍රිකෝණ සංඛ්‍යා රටාවේ 5 වන හා 6 වන පද දෙක ලබාගන්න. (ල 4)

(ii) එම පද දෙකෙහි එකතුව 1 න් පටන් ගන්නා සමචතුරස්‍ර සංඛ්‍යා රටාවේ කී වන පදය ද? (ල 2)

(b) අලුත්වැඩියා කිරීමට යෝජිත පාලමක් ඉදිරිපස සවිකර තිබූ පුවරුවක් මෙහි දැක්වේ. ස්කන්ධය මෙට්‍රික් ටොන් 7. 5 ක් වූ ලොරියක 50 kg ස්කන්ධය සහිත සහල් මලු 100 ක් පටවා ඇත.




(i) සහල් සමග ලොරියේ මුළු ස්කන්ධය මෙට්‍රික් ටොන් කීයද? (ල 2)

(ii) මෙම ලොරිය පාලම මතින් ගමන් කිරීම නුසුදුසු බව පෙන්වන්න. (ල 2)

(iii) ලොරිය පාලම මතින් ගමන් කිරීම සඳහා ඉවත් කළ යුතු අවම සහල් මලු ගණන සොයන්න. (ල 1)

PARCEL NO

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න



## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**